කොළඹ විශ්වවිද්‍යාලය – 2014

කොළඹ විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්ව නොතිබූ රු. 8,105,737 ක පිරිවැයක් දරා තිබූ ඉදිකරමින් පැවති නේවාසිකාගාරයේ නාන කාමර හා වැසිකිළි ප්‍රාග්ධනිත කර තිබූ අතර ඒ වෙනුවෙන් දෙසැම්බර් මාසය සඳහා රු. 33,731 ක්ෂය ප්‍රතිපාදන ඇති කර තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී පාලි මණ්ඩපයේ 2014/2015 ජනමාධ්‍යවේදී පශ්චාත් උපාධි පාඨමාලාව අවසන් වී ඇතත් ඒ වෙනුවෙන් අයකරගතයුතු රු.540,000 ක් වූ පාඨමාලා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සේවය හැර ගිය නිළධාරීන් 27 දෙනෙකුගෙන් අයවිය යුතු රු.963,348 ක් වූ ආපදා, උත්සව, පරිගණක හා සේවක ණය ශේෂ වසර 05 ක සිට පරිශේෂව පැවැති අතර මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

උපාධි අධ්‍යයන පීඨයේ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සම්බන්ධව උපදේශන ගිවිසුම අනුව විශ්වවිද්‍යාලය විසින් මධ්‍යම ඉංජිනේරු සේවා උපදේශක කාර්යාංශයට රු.2,995,373 ක මුදලක් ගෙවීමට එකඟව තිබියදීත් උපාධි අධ්‍යයන පීඨයේ නව ගොඩනැගිල්ල අධීක්ෂණය සඳහා තාක්ෂණික නිපුණත්වයක් නොමැති පීඨයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී පත් කර තිබුණි. ඒ සඳහා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන හා මූල්‍ය කමිටු නිර්දේශ වලට පටහැනිව මාසික වැටුපෙන් සියයට 78 ක දීමනාවක් වශයෙන් රු.522,000 ක් ගෙවා තිබුණි.

### 2.5 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති , රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | (i) රෙගුලාසි ප්‍රකාරව එක් අවස්ථාවකදී ලබා දියහැකි අත්තිකාරම් වල උපරිම සීමාව රු.20,000 ක් වුවත් නියැදි විගණන පරීක්ෂාවට අනුව විශ්වවිද්‍යාලය විසින් අවස්ථා දෙකකදී රු. මිලියනය ඉක්මවා අත්තිකාරම් ලබා දී තිබුණු අතර ආචාර්යවරුන් 41 දෙනෙකු ලබාගෙන තිබූ රු.4,395,760 ක් දින 30 සිට දින 316 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද කර පියවා තිබුණි. |
| | (ii) පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා ප්‍රකාශන ආයතන වෙත 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ලබාදී තිබූ එකතුව රු.466,485 ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| | (iii) නිසි පරිදි ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව අත්තිකාරම් ලබා දීම හේතුවෙන් විශ්ව විද්‍යාලයේ සහ ශ්‍රීපාලි මණ්ඩපයේ නිලධාරීන් තිස්දෙදෙනෙකුට ලබා දී තිබූ එකතුව රු.769,005 ක් වූ අත්තිකාරම්වලින් සියයට 44 සිට සියයට 71 දක්වා ඉතිරි වී තිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| (i) XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය හා X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | සිදුකළ නියැදි විගණන පරීක්ෂණයේදී ශාස්ත්‍ර පීඨයේ දෙපාර්තමේන්තු අටක අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම, පිටවීම හා නිවාඩු සඳහා ලේඛණ නඩත්තු කර නොතිබුණි. |
| (ii) XIX පරිච්ඡේදය | විශ්වවිද්‍යාලය විසින් අත්සන් කළ ගිවිසුම් ප්‍රකාරව නිල නිවාස වල රැඳී සිටි නිලධාරීන්ගේ මූලික වැටුපෙන් සියයට 10 ක් බදු කුලී වශයෙන් අය කර ගත යුතු වුවත් 2014 නොවැම්බර් 01 – 2015 පෙබරවාරි 28 දක්වා රැඳී සිටි නිලධාරින්ගෙන් රු.180,289 ක් අයවිය යුතු වුවත් රු.81,700 ක් පමණක් අයවී තිබුණු අතර රු.98,589 ක් අයකරගත යුතුව පැවතුණි. |
| (ඇ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6(1)(අ) වගන්තිය | කොන්ත්‍රාත් ගිවිසුම් පිරිවැය රු. මිලියන 05 ඉක්මවන අවස්ථාවක සෑම ලන්සුකරුවෙක්ම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වියයුතු වුවත් ගිවිසුම් වටිනාකම රු.47,478,427 ක්වූ කොන්ත්‍රාත් 05 ක් වෙනුවෙන් එසේ ලියාපදිංචි කර නොතිබුණි. |
| (ඈ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 15 (v) වගන්තිය සහ 2010 ඔක්තෝබර් 15 දිනැති අංක 932 දරන | කොළඹ විශ්වවිද්‍යාලයේ බාහිර පාඨමාලා 19 ක් හා ශ්‍රී පාලි මණ්ඩපයේ බාහිර පාඨමාලා 01 ක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය

(ඉ) **2013 ඔක්තෝබර් 10 දිනැති අංක 11/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය**

**පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට නිවාඩු ලබාදීමේදී පශ්චාත් උපාධිය හැදෑරීම තමා සේවය කරන විශ්වවිද්‍යාලයෙන් බැහැර වෙනත් විශ්වවිද්‍යාලයක සිදුකළ යුතු වුවත් අධ්‍යාපන පීඨයේ ආචාර්යවරු 05 දෙනෙකු එම පීඨයේම හා ඉන් ආචාර්යවරු තිදෙනෙකු එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස කටයුතු අධීක්ෂණය කෙරෙන පශ්චාත් උපාධියක් හදාරා තිබුණි.**

(ඊ) **2004 ජනවාරි 26 දිනැති අංක 2004/පුස්/1 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ චක්‍රලේඛය**

**ශ්‍රී පාලි මණ්ඩපයේ ප්‍රවර්තන වර්ෂය හෝ ඊට පෙර වර්ෂයේ පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.**

(උ) <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>

**2007 ඔක්තෝබර් 27 දිනැති**

(i) **අංක 09/2007(III) හා 09/2007(i) (v) දරන චක්‍රලේඛය**

**විශ්‍රාමිකයකු නැවත සේවයේ යෙදවීමේ උපරිම කාලය මාස 12 කට සීමා වියයුතු අතර විශ්‍රාමිකයෙකු නැවත සේවයේ යොදවනු ලබන කාල සීමාව තුළදී සුදුසු අනුප්‍රාප්තිකයකු හඳුනාගෙන පුහුණු කරනු ලැබියයුතු වුවත් විශ්‍රාමික නියෝජ්‍ය ලේඛකාධිකාරීවරයෙකු අඛණ්ඩව වසර 7 කට වැඩිකාලයක සිට සේවයේ යොදවා ගෙන තිබුණු අතර අනුප්‍රාප්තිකයකු හඳුනාගෙන බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි.**

(ii) **2007 අගෝස්තු 24 දිනැති අංක 09/2007 දරන චක්‍රලේඛය**

**නිලධාරීන්ට නිත්‍ය තනතුරට අදාල අනෙකුත් පහසුකම් සම්බන්ධයෙන් සුදුසු පරිදි මහා භාණ්ඩාගාරයේ නිර්දේශ ලබා ගැනීමකින් තොරව කාර්ය පැවරුම් පදනමට නැවත සේවයේ යොදවා තිබූ විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂයේ දී නිවසේ සිට සේවයට යාමට හා ඒමට ප්‍රවාහන පහසුකම් ලබා දී තිබුණි.**

**විශ්‍රාමික අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය නැවත විශ්වවිද්‍යාල සේවයේ යොදවා ගැනීමේ දී අවධාරනය කරනු ලබන සේවා අවශ්‍යතාව, එය ආවරණය කර ගත හැකි විකල්පයන් මෙන්ම ආයතනයේ සුරක්ෂිතතාවයට අනුකූල වන පරිදි සේවා කොන්දේසි පැනවීම සම්බන්ධයෙන් කළමනාකරණය නොසැලකිලිමත් භාවයෙන් කටයුතු කර ඇති බව පත්වීම් කොන්දේසි පරීක්ෂා කිරීමෙන් විගණනයේ දී නිරීක්ෂණය වූ අතර ඒ අනුව විවිධ මූල්‍යමය ගැටලු වලට මුහුණ දීමට විශ්ව විද්‍යාලයට සිදුවීමට අවස්ථාව ඇති බව නිරීක්ෂණය වේ.**

| | | |
|---|---|---|
| (iii) | 2007 අගෝස්තු 27 දිනැති අංක 09/2007(1) දරන චක්‍රලේඛය | අත්‍යාවශ්‍ය තනතුරකට අනුප්‍රාප්තිකයෙකු පත් කිරීම අපහසු විටකදී හා වැඩ බැලීම මගින් අදාල තනතුරෙහි කටයුතු ආවරණය කරගත නොහැකි විටක දී පමණක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත පත් කිරීම් කළ යුතු වුවත් එයට පටහැනිව නිලධාරීන් 07 දෙනෙකු මාස 06 සිට වසර 07 ක් දක්වා කාලසීමාවක් තුළ කාර්ය පැවරුම් පදනම මත පාලක සභාවේ අනුමැතිය මත බඳවාගෙන තිබුණි. |
| (ඖ) | 2010 ඔක්තෝබර් 29 දිනැති අංක 05/2010 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | මාසික වැටුප් ගෙවීමේදී අවදානම අඩුකර ගැනීම සඳහා බැංකුගත කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වුවත් 2015 පෙබරවාරි 26 වෙනි දින භෞතික පරීක්ෂාවේදී මුදල් අයකැමි සතුව රු.5,139,744 ක අතැති මුදල් ශේෂයක් පැවති අතර අධ්‍යයන හා අනධ්‍යයන නිලධාරීන් 381 දෙනෙකුගේ මාසික වැටුප වූ රු.17,250,260 ක් එනම් මුළු වැටුප් වලින් සියයට 21 ක් රු.100,000 සිට රු.310,720 දක්වා වූ අනෙකුත් ගෙවීම් මුදලින් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.372,221,037 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.214,339,468 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.157,881,569 කින් වැඩිවීම සඳහා රජයේ ප්‍රදාන රු.253,026,994 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළඹ විශ්වවිද්‍යාලය හා ශ්‍රීපාලි මණ්ඩපය විසින් පිළියෙල කරන අධ්‍යයන කාල සටහනේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීම්වලට අදාල දින වකවානු සඳහන් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර සිසුන් සඳහා පවත්වන විභාගවල ප්‍රතිඵල මාස 3කින් නිකුත් කළ යුතු වුවත් 2013/2014 අධ්‍යයන වර්ෂය තුල කළමනාකරණ පීඨයේ අභ්‍යන්තර සිසුන් සඳහා පවත්වා ගෙන යන ව්‍යාපාර පරිපාලන උපාධි විභාග ප්‍රතිඵල නිකුත් කිරීම පිළිබඳ නියැදි පරීක්ෂාවේදී ප්‍රථම, තෙවන හා පස්වන වර්ෂාර්ධ ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 6 සිට 8 දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි.

(ඇ) ශිෂ්‍ය පැමිණීම මත විෂයයන් සඳහා ලකුණු සියයට 10 සිට සියයට 25 අතර ලබාදීමත්, පැමිණීම අඩු ශිෂ්‍යයන් සඳහා විභාගවලට පෙනී සිටීමට අනුමැතිය නොදීමත් වැනි කරුණු

සනාථකර ගැනීම සඳහා නිශ්චිත ආකෘතියකට අනුව විධිමත් ශිෂ්‍ය පැමිණීමේ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ඈ) Master of Philosophy (part time) 2012 පාඨමාලාව සඳහා නිකුත් කරන ශිෂ්‍ය අත්පොත අනුව අවම වශයෙන් පැමිණීම සියයට 70 ක් සම්පූර්ණ නොකරන ශිෂ්‍යයන්ට පරීක්ෂණ ක්‍රමවේදය (Research Methodology) අවසන් විභාගයට සිටීමට ඉඩ නොදෙන බව සඳහන් කර තිබුණද පාඨමාලාව සාර්ථකව අවසන් කළ ශිෂ්‍ය ලේඛනය තුළ සිටින ශිෂ්‍යයින් පස්දෙනෙක් පාඨමාලාවට සහභාගී වූ බවට ශිෂ්‍ය පැමිණීමේ ලේඛන වල සඳහන් කර නොතිබුණි.

**4.2** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී පාලි මණ්ඩපයේ පුස්තකාලය සඳහා 2013 ජුලි 08 දින ලබාගත් රු.348,800 ක් වටිනා පුටු 40 ක් සහ මේස 07 ක් විගණිත දිනය වූ 2015 මාර්තු 25 දින වනවිටත් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව කියවීම් ශාලාවේ ගබඩා කර තිබුණි.

(ආ) ශ්‍රී පාලි මණ්ඩපය සතුව ධාවනයට සුදුසු තත්වයේ වාහන 05 ක් පැවතියද රියදුරු මහතුන් දෙදෙනෙකු පමණක් සිටින බැවින් සෑම විටම වාහන තුනක් සහ සෆාරි වර්ගයේ ජීප් රථයක් වසර 06 ක කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) ශ්‍රී පාලි මණ්ඩපය විසින් ලංකා බැංකුවෙහි පවත්වා ගෙන යන ජංගම ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,529,295 ක බැංකු ශේෂයක් පැවතුණු අතර 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සාමාන්‍ය බැංකු ශේෂය රු. 4,937,714 ක් වුවද එම මුදල් කෙටිකාලීන ආයෝජන වල යෙදවීමෙන් තොරව ජංගම ගිණුමේ නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල විශේෂිත අරමුදල් යටතේ දක්වා ඇති රු.4,211,513ක ශේෂ 11 ක් වසර 3 ක සිට අක්‍රියව පැවතුණි.

**4.3** කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් 31 දෙනෙකුගෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු රු.34,747,649 ක් ලිපිනය සොයාගත නොහැකි වීම හා පසුවිපරම් කටයුතු සිදුනොකිරීම වැනි හේතු නිසා අයකරගැනීමට නොහැකි වී නොතිබුණි.

(ආ) කොළඹ විශ්වවිද්‍යාලය සතු නේවාසිකාගාර 07 ක් හා කුලී පදනමට ලබාගත් නේවාසිකාගාර 03 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු .5,040,000 ක් වැය කර තිබිය දී කුලී නේවාසිකාගාර වල ශිෂ්‍යයින් 2,629 කට පහසුකම් සැපයිය හැකි වුවද ශිෂ්‍යයින් 2,223 කට පමණක් පහසුකම් සපයා තිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඇතුළත් රු.31,485,140,000 ක් වටිනා ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පු ලබාගැනීමට 2015 ජුනි 29 දින වනවිටත් කටයුතු කර නොතිබුණු අතර මෙම ඉඩම් සඳහා පිඹුරුපත් සැකසීම සඳහා පෞද්ගලික සමාගමකට 2015 ජුනි 19 දින භාරදී ඇති බව විශ්වවිද්‍යාලයේ නිසි බලධාරීන් විසින් දන්වා තිබුණි.

(ඈ) ශ්‍රී පාලි මණ්ඩපයේ ආචාර්යවරියක් සඳහා 2007 සැප්තැම්බර් 22 දින සිට 2008 දෙසැම්බර් 14 දින දක්වා අධ්‍යයන නිවාඩු ලබාදී තිබුණ ද ඇයගේ ආචාර්ය උපාධිය පිළිබඳ කිසිදු

ප්‍රගතියක් විශ්වවිද්‍යාලයට වාර්තා කර නොතිබුණි. 2010 නොවැම්බර් 16 දිනැති 438 වන පාලක සභා රැස්වීමේදී සේවය අතහැරගියා සේ සැලකීමට තීරණය කර තිබු අතර ඇයගෙන් විශ්වවිද්‍යාලයට රු.2,931,113 ක මුදලක් අයවීමට තිබුණි. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් 2014 මාර්තු 04 දිනැතිව නීතිපතිවරයාට ලිපියක් ඉදිරිපත් කර ඇතත් පසුවිපරම් කටයුතු සිදුකර නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.4** මතභේදයට තුඩුදෙන ගණුදෙනු
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල පනත මගින් ප්‍රතිපාදන සලසා නොතිබියදී හා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් ද තොරව, ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ආධාර ඇතිව විශ්වවිද්‍යාලය වාණිජකරණය අරමුණු කරගෙන විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය යොදා ගනිමින් ඇපයෙන් සීමිත ෂෙල් සමාගමක් පිහිටුවා තිබුණි. 2014 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා මෙමගින් රු.2,540,469 ක ආදායමක් උපයා තිබූ අතර රු.1,935,908 ක වියදමක් දරා තිබුණද මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

(ආ) සප්ත වාර්ෂික නිවාඩු ලබාගත් ආචාර්යවරුන් තුන්දෙනෙකු එම කාලය තුලදී සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කොන්ත්‍රාත් පදනම මත රාජකාරි කර තිබූ අතර අදාළ ආයතන මඟින් එකතුව රු.3,068,793 ක් වූ දීමනාවක් ගෙවා තිබියදී ස්ථිර රාජකාරි ස්ථානය වූ කොළඹ විශ්වවිද්‍යාලය මඟින් ද රු.7,202,882 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. ඒ අනුව එකම නිලධාරීන් තුන්දෙනෙකු වෙනුවෙන් භාණ්ඩාගාර අරමුදලින් වැටුප් හා දීමනා දෙවරක් ගෙවා තිබූ බව විගණනයේදී අනාවරණය විය.

**4.5** කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
-------------------------------------

සුජාතා ජයවර්ධන නේවාසිකාගාරයේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමක් වෙත 2013 දෙසැම්බර් 24 දින රු.22,642,292 ක වටිනාකමකට පිරිනමා තිබූ අතර එය 2014 ජුනි 22 දින නිම කිරීමට නියමිතව තිබුණි. 2015 ජුනි 30 දින වනවිට දින 373ක් ප්‍රමාදවී තිබුණද මුළු කොන්ත්‍රාත්තුවෙන් සියයට 40 ක් පමණක් ඉදිකිරීම් නිමකර තිබියදී රු.10,211,186 ක මුදලක් ගෙවා තිබුණි. එහෙත් ප්‍රමාද කාලය වෙනුවෙන් අයකළ යුතු රු.747,195 ක ප්‍රමාද දඩ අයකර ගෙන නොතිබුණි. මන්දගාමීව ඉදිකිරීම් කටයුතු සිදුකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්තු කටයුතු අධීක්ෂණය සඳහා උපදේශකවරයෙකු පත්කර ඔහු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.727,000 ක දීමනාවක් ද ගෙවා තිබුණි.

**4.6** හඳුනාගත් පාඩු
------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 -2015 සංයුක්ත සැලැසුමේ ඇතුලත් කර තිබුණු මහල් හයකින් යුත් විභාග ශාලාවක් ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේදී මැනීම සහ ඉංජිනේරු සැලැස්මක් (Surveying & preparation of Engineering plan) පිළියෙල කිරීම වෙනුවෙන් රු.54,835 ක් ගෙවා තිබුණු අතර මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම අතහැර දමා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍යාවන් 300 කට පහසුකම් සැපයිය හැකි නව නේවාසිකාගාරයක් (මුත්තයියා පාර නේවාසිකාගාරය) ඉදිකිරීමේ ව්‍යාපෘතියක් 2005 වර්ෂයේ දී ආරම්භ කර ඒ සඳහා 2005, 2006 හා 2010 වර්ෂවල රු.268,052 ක් වැයකර ඇතත් ව්‍යාපෘතිය අතරමඟ නතර කර තිබුණි.

## 05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය අනුව එක් එක් කාර්යය සම්බන්ධයෙන් වගකීම එක් එක් නිලධාරීන් වෙත පැවරෙන ආකාරයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවත් ශ්‍රී පාලි මණ්ඩපයේ නිලධාරීන් සඳහා වගකීම පැවරෙන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.2 කාර්ය මණ්ඩල පුරප්පාඩු පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හා ශ්‍රී පාලි මණ්ඩපයේ අනුමත කාර්ය මණ්ඩලය පිළිවෙලින් 658 ක් හා 123 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 522ක් හා 93 ක් වුයෙන් පුරප්පාඩු පිළිවෙලින් 136 ක් හා 31 ක් ද ශ්‍රී පාලි මණ්ඩපයේ එක් තනතුරක් අතිරික්තව පවතින බවද නිරීක්ෂණය විය.

(ආ) ඉඩම් සහ ගොඩනැගිලි නඩත්තු අංශයේ වැඩ අධීක්ෂක තනතුර මාස 8 ක කාලයක සිට ද විද්‍යාල මන්දිර පරිපාලන අංශයේ පුරප්පාඩුව පවතින නියෝජ්‍ය/ සහකාර ලේඛකාධිකාරී තනතුරු 3 ක් මාස 6 සිට අවුරුදු 08 ක කාල පරාසයක සිටද කාර්ය පැවරුම් පදනම මත ආවරණය කෙරමින් තිබූ අතර නව බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පරීක්ෂා කළ නියැදියට අනුව නියෝජ්‍ය ලේඛකාධිකාරී එක් තනතුරක් සහ ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී තනතුරක්ද පුරප්පාඩුව පැවති අතර භෞතික අධ්‍යාපන (ක්‍රීඩා) අංශයේ අධ්‍යක්ෂ තනතුරු 02 ක් වසර 02 කට වැඩි කාලයක සිට වැඩ බැලීමේ පදනම මත ආවරණය කරමින් පවති.

## 06. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවිය.

(අ) මූල්‍ය පාලනය
(ආ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ණය ගැති හා ණය හිමි පාලනය
(ඉ) සේවක මණ්ඩල කළමනාකරණය